අද city edition
2023-12-13
012 / 245
RS.40/=
ලොබා බදාදා

# දෙසැම්බරයේදී ඩෙංගු රෝගීන් 4,052ක්



>>P2

# හෙන්රි පේද්‍රිස් ඝාතනය ගැන වසර 108කට පසු පරීක්ෂණයක්

## ජනපති යෝජනාවට කැබිනට් අනුමැතිය | ත්‍රිපුද්ගල කමිටුවකුත් පත්කරයි

**නවෝද්‍යා පවනි**

යටත් විජිත යුද අධිකරණයේ තීන්දුවක් මත වසර 108කට පෙර සිදුකළ එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් ඝාතනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට කැබිනට් අනුමැතිය ලබා දී තිබේ.

ඒ අනුව එම ඝාතනය පිළිබඳ සැබෑ තොරතුරු අනාවරණය කරගෙන ඒ මහතාට යුක්තිය ඉටු කිරීම පිණිස අදාළ කරුණු අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අනිල් ගුණරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කිරීමට නියමිතය.



ජනාධිපතිවරයා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත.

ශ්‍රී ලංකාවේ යටත් විජිත පාලන අධිකාරිය විසින් රජයට එරෙහිව කැරලි කෝලාහල සහ රාජද්‍රෝහී ක්‍රියාවන් සිදු කළේ යැයි චෝදනාව එල්ල කරමින් යුද අධිකරණයක් හමුවට පමුණුවා රාජද්‍රෝහී චෝදනාවට වරද කරු කොට එවකට 27 වියැති එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් මහතා 1915-7-7 වන දින කිසිදු අභියාචනයක් නොසලකා මරණ දඬුවමට ලක් කර ඇත.

ඔහුගේ දේහය යුද නීතිය යටතේ වරදකරු වූ අපරාධකරුවකු ආදාහනය කිරීමට නියම කර ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් හෙළි නොකළ පරිශ්‍රය පරිසරයක ආදාහනය කර තිබේ.

හෙන්රි පේද්‍රිස් ඝාතනය එවකට මෙරට පාලනය කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සිදු කරන ලද සැලැස්මක ප්‍රතිඵලයක් වශයෙන් පසුව හඳුනා ගෙන තිබේ.

# අධි සුඛෝපභෝගී දුම්රිය 2ක් කොට උඩ



දෙමටගොඩ අංගණයේ ගාල් කර දිරාපත්වීමට හැරලා

දුම්රියේ 'මනමාලියත්' ඒ අතර

>>P2

# බන්ධනාගාරය වෙනුවට 'නිවාස අඩස්සියට'

නීති ප්‍රතිපාදන හඳුන්වාදීමට යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමේට කමිටුවක්



>>P2

# එළවළු මිල තවත් ඉහළට



>>P2

# ආදිවාසී ජනයාට නව පාර්ලිමේන්තු පනතක්

>>P2

# රොෂාන් විපක්ෂයට



>>P2

# කන්දකාඩුවෙන් පැනගිය රැඳවියන් 129දෙනා 22දා දක්වා රිමාන්ඩ්

- සෙසු සැකකරුවන් 7දෙනාවත් අත්අඩංගුවට ගන්නැයි නියෝග



>>P6

# අයහපත් කාලගුණය නිසා බදුල්ලේ 1721ක් පීඩාවට

>>P2

# කුරගලින් ශිලා යුගයේ ගල් ආයුධ සොයා ගැනේ



>>P7

# තැපැල් වර්ජනය අවසන්

ගැටලුවලට විසඳුම් නැතිනම් සෙසු රාජ්‍ය සේවකයන් සමග ඒකාබද්ධ වෘත්තීය ක්‍රියාමාර්ග

>>P2

රාජ්‍ය සේවකයන්ට රු.20,000ක් මේ යෝජනාවක් අද සම්මත නොකළොත්

# වැඩවර්ජනයක් අරඹනවා

- රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව

>>P2










## කාලගුණය

උපරිම උෂ්ණත්වය
32°C රත්නපුර

අවම උෂ්ණත්වය
12°C නුවරඑළිය

වැසි තත්ත්වය

උතුරු/ උතුරුමැද/ නැගෙනහිර/ ඌව/ බස්නාහිර පළාත් හා ගාල්ල/ මාතර/ හම්බන්තොට/ නුවරඑළිය/ අම්පාර දිස්ත්‍රික්කවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

මීදුම් තත්ත්වය

බස්නාහිර/ සබරගමුව/ මධ්‍යම/ දකුණු හා ඌව පළාත්වල ඇතැම් ස්ථානවල උදෑසන කාලයේදී මීදුම් තත්ත්වයක් පැවතිය හැකිය.

මුහුදේ තත්ත්වය

පොතුවිල් සිට මඩකලපුව, ත්‍රිකුණාමලය හා කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සුළඟේ වේගය පැ.කි.මී. 25-35 පමණ වෙයි.


අද කර්තෘ මණ්ඩලය

ලිපිනය: අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන: 2479670, 2479671

ෆැක්ස්: 2479668

විද්‍යුත් තැපෑල: ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය: 011 2479 830

බෙදාහැරීමේ අංශය: 011 2479 625

දායකත්ව අංශය: 011-2479 626



අද පාඨක අයිතීන් සුරැකීම

අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka

96, කිරුළ පාර, කොළඹ 05.

| | |
|---|---|
| දුරකතනය | 5 353 635 |
| ෆැක්ස් | 5 335 500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |


# රොෂාන් විපක්ෂයට

නවෝද්‍යා පවනි

හිටපු ක්‍රීඩා අමාත්‍ය රොෂාන් රණසිංහ මහතා අද (13දා) විපක්ෂයේ අසුන් ගැනීමට නියමිත බව වාර්තා වේ.

ඒ අනුව අයවැයට එරෙහිව ඡන්දය ලබාදී විපක්ෂයේ අසුන් ගැනීමට නියමිත බව වාර්තා විය.

එයින් අනතුරුව ඒ මහතා අනුගමනය කරනු ලබන දේශපාලන ස්ථාවරය පිළිබඳ මෙතෙක් වාර්තා වී නැතත්, ඒ මහතා ස්වාධීනව කටයුතු කිරීමට නියමිත බවද වාර්තා වේ.

# දෙසැම්බරයේදී ඩෙංගු රෝගීන් 4,052ක්

ඉන්දික හේවාවිතාරණ

මේ මස 01වැනිදා සිට ඊයේ (12දා) දිනය දක්වා කාලය තුළදී ඩෙංගු රෝගීන් 4,052ක් වාර්තා වී තිබෙන අතර, මේ අනුව මේ වසරේ ගෙවුණු කාලය තුළදී ඩෙංගු රෝගීන් 80,540ක් වාර්තා වී තිබේ.

මේ වනවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස බලප්‍රදේශ 61ක ඩෙංගු අධිඅවදානම් තත්ත්වයෙන් පැතිර යන බවද සෞඛ්‍ය අංශ පෙන්වාදෙයි.

මේ වසරේ ජනවාරි මාසයේ සිට ඊයේ දිනය දක්වා කාලය සැලකීමේදී ඩෙංගු රෝගය නිසා පුද්ගල මරණ 47ක් සිදුව තිබෙන අතර, පසුගිය මාසය තුළදී ඩෙංගු රෝගීන් 7,995ක් වාර්තා වී ඇත.

ඔක්තෝබර් මාසය තුළදී ඩෙංගු රෝගීන් 4,010ක් වාර්තා වී ඇති අතර, සැප්තැම්බර් මාසයේ රෝගීන් 2,605ක් වාර්තා වී තිබේ.

සමස්ත රෝගීන් සැලකීමේදී බස්නාහිර පළාත තුළින් ඩෙංගු රෝගීන් 37,320ක් වාර්තා වී තිබෙන අතර, එය සමස්ත රෝගීන්ගේ ප්‍රතිශතයක් ලෙස 46.4%කි. මධ්‍යම පළාතෙන් රෝගීන් 10,188ක් වාර්තා වී තිබෙන අතර, එය ප්‍රතිශතයක් ලෙස 12.6%කි.

වයඹ පළාතෙන් රෝගීන් 7,008ක් වාර්තා වී තිබෙන අතර, එය සමස්ත රෝගීන්ගේ ප්‍රතිශතයක් ලෙස 8.7%කි. නැගෙනහිර පළාත තුළින් රෝගීන් 6,597ක් වාර්තා වී තිබෙන අතර, එය ප්‍රතිශතයක් ලෙස 8.2%කි. සබරගමුව පළාතෙන් රෝගීන් 6,493ක් වාර්තා වී තිබේ. එය ප්‍රතිශතයක් ලෙස 8.0%කි. මේ ආකාරයට සෑම පළාතකින්ම රෝගීන් වාර්තා වී ඇත.

දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේදී වැඩිම රෝගීන් ප්‍රමාණයක් වාර්තා වී තිබෙන්නේ, කොළඹ දිස්ත්‍රික්කයෙනි. එම දිස්ත්‍රික්කයෙන් රෝගීන් 17,017ක් වාර්තා වී තිබේ. එය සමස්ත රෝගීන්ගේ ප්‍රතිශතයක් ලෙස 21.1%කි. ගම්පහ දිස්ත්‍රික්කයේ රෝගීන් 15,444ක් වාර්තා වී තිබෙන අතර, එය ප්‍රතිශතයක් ලෙස 19.2%කි. මහනුවර දිස්ත්‍රික්කයේ රෝගීන් 8,247ක් වාර්තා වී තිබෙන අතර, එය ප්‍රතිශතයක් ලෙස 10.2%කි.

කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 3,211ක්, මඩකලපුව දිස්ත්‍රික්කයෙන් රෝගීන් 2,618ක්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 2,069ක්, රත්නපුර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 3,121ක්, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 3,365ක් වාර්තා වී ඇත.

# එළවළු මිල තවත් ඉහළට

ඉන්දික හේවාවිතාරණ

බොහෝ ප්‍රදේශවල අමු මිරිස්,ලොකුලූනු, අර්තාපල්, රතුලූනු මිල ඊයේ(12දා) වන විට සැලකිය යුතු මුදලකින් ඉහළ ගොස් තිබේ. සුදු සීනි කිලෝවක මිල රුපියල් තුන්සීය ඉක්මවා ගොස් ඇත.

රු.260 -රු. 290 අතර මිලකට අලෙවි වූ ලොකු ලූනු කිලෝවක සිල්ලර මිල ඊයේ (12දා) රු. 340 -රු. 390 දක්වා ඉහළ ගොස් තිබෙන අතර, රතු ලූනු කිලෝවක මිල රු.600- රු.650 දක්වා ඉහළ ගොස් තිබේ.

දේශීය අර්තාපල් කිලෝවක මිල රු. 420 - රු. 460 දක්වා ද රු. 210- රු. 220 අතර මුදලකට අලෙවි වූ ආනයනික අර්තාපල් කිලෝවක මිල රු. 240- රු. 260 අතර මිලක් දක්වා ද ඉහළ ගොස් ඇත. අමු මිරිස් කිලෝවක සිල්ලර මිල රු.1400 ක් දක්වා ඉහළ ගොස් තිබේ. කුකුළු මස් මිලද ඉහළ ගොස් තිබෙන අතර ඊයේ දිනය වන විට හරක් මස් කිලෝවක් රු. 2300ක් හා එළු මස් කිලෝවක් රුපියල් 3500ක් දක්වා ඉහළ ගොස් තිබෙන බව වෙළෙඳ පොළ සොයා බැලීම්වලදී තහවුරු වේ.

මාළු මිල සාමාන්‍ය මට්ටමේ පවතින අතර ඊයේ (12දා) සමහර ප්‍රදේශවල සූඩයා කිලෝවක් රුපියල් 100කටද, සාලයා කිලෝවක් රුපියල් 220කටද අලෙවි කර තිබේ.අනෙකුත් මිල ගණන් මෙසේය.

අලගොඩුවා කිලෝවක් රුපියල් 700යි. බලයා කිලෝවක් රුපියල් 600යි. හුරුල්ලෝ කිලෝවක් රුපියල් 550යි. කුම්බලාවා කිලෝවක් රුපියල් 700යි. බෝල්ලු කිලෝවක් රුපියල් 700යි. බලයා කිලෝවක් රුපියල් 800යි. අලගොඩුවා කිලෝවක් රුපියල් 800යි. කෙලවල්ලා කිලෝවක් රුපියල් 1000යි. ලින්නා කිලෝවක් රුපියල් 750යි. තෝරු කිලෝවක් රුපියල් රු 2500යි. තලපත් කිලෝවක් රුපියල් 1800යි. පරව් කිලෝවක් රුපියල් 1200යි. ගල් මාලු කිලෝවක් රුපියල් 1000යි. ඉස්සෝ කිලෝවක් රුපියල් 1300කටද, දැල්ලෝ කිලෝවක් රුපියල් 1000 කටද අලෙවි වී තිබේ.

# අයහපත් කාලගුණය නිසා බදුල්ලේ 1721ක් පීඩාවට

හල්දුම්මුල්ල -සමන් පාලිත නානායක්කාර/හපුතලේ - නායනානන්ද බුවනෙක

බදුල්ල දිස්ත්‍රික්කයේ පවුල් 485ක පුද්ගලයන් 1721දෙනෙකු අයහපත් කාලගුණයේ බලපෑමට ලක්වී සිටින බව බදුල්ල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඊයේ (12දා) පැවසීය.

ඉන් පවුල් 259ක පුද්ගලයන් 868දෙනෙකු සුරක්ෂිත මධ්‍යස්ථාන 11ක රඳවා ඇති බවද පුද්ගලයන් 396දෙනෙකු ඥාති නිවෙස්වල රඳවා ඇති බවද එම මධ්‍යස්ථානය කියයි.

ගමක්ම යට වූ කොස්ලන්ද කැලිපනාවල හා කොටබක්ම නාය යාමෙන් පවුල් 83ක පුද්ගලයන් 279දෙනෙකු සුරක්ෂිත මධ්‍යස්ථානයක රඳවන තුරු ඥාති නිවෙස්වලට යොමු කර ඇති බව හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කේ වී.ජේ. ප්‍රියංගිකා මහත්මිය කීවාය.

කැලිවල නායට ගොදුරු වූ ගෙවල්වල වහලයේ සිට ගත හැකි ද්‍රව්‍යයන් ගලවා ඉවත් කර ගැනීම සිදුවේ. ජීවිත කාලය පුරා හරිහම්බ කර ගත් සියලු දේපළ අහිමි වී ගිය බවත් කලකට පෙර අතිසුන්දර වෙල්යායක්ව තිබූ කැලිපානාවල වෙල්යාය පස්වලින් වැසෙමින් යන බවත් ප්‍රදේශවාසීහු පවසති.

ගම්මානයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සහ ජනතාවගේ පෝෂණය සෞඛ්‍ය හා ඉදිරි රැකබලා ගැනීම් පිළිබඳ අදාළ රාජ්‍ය ආයතනවල විශේෂ අවධානය මේ වන විට යොමු වී තිබේ.

මේ අතර කොළඹ බදුල්ල අනූනවය (99) ප්‍රධාන මාර්ගයේ හාලිඇල උඩුවර නාය ගිය ස්ථානය තවදුරටත් තනි මං තීරුවක් විවෘත කර ඇති අතර පාසල් බස් රථ මගී බස් රථ සැහැල්ලු වාහන හැර සියලු බර වහන සඳහා වසා තබන බවද, විකල්ප මාර්ගය භාවිත කරන ලෙසද හාලිඇල පොලීසිය රියදුරන්ට දැනුම් දෙයි.

එම ස්ථානයේ අධිබලැති විදුලි රැහැන් පද්ධතිය ද නවීකරණය කිරීමට මේ වනවිට කටයුතු කරමින් තිබේ. එවිට එම මාර්ගයේ රථවාහන ධාවනයට සුළු බාධා ඇතිවන බවද කියයි. උඩුවර පහේ කණුව අසල නාය ගිය ස්ථානය යළි පිරිසකර කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය විය හැකි බව බදුල්ල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ ටී. එම්. එල්. උදය කුමාර මහතා වැඩිදුරටත් පැවසීය.

# බන්ධනාගාරය වෙනුවට 'නිවාස අඩස්සියට'

## - නීති ප්‍රතිපාදන හඳුන්වාදීමට යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමේ කමිටුවක්

නවෝද්‍යා පවනි

රක්ෂිත බන්ධනාගාරගත කිරීමට විකල්පයක් වශයෙන් නිවාස අඩස්සියේ රඳවා තැබීම සඳහා නීතිමය විධිවිධාන හඳුන්වාදීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දී තිබේ.

මෙරට බන්ධනාගාරවල පවතින තදබදය දීර්ඝකාලීන ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇති බැවින් මෙම නව නීතිය හඳුන්වා දීමට නියමිත බව ද වාර්තා වේ.

එම ගැටලුවට පිළියමක් වශයෙන් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට හා බන්ධනාගාරගත කිරීමට විකල්පයක් ලෙස සුදුසු නඩු කටයුතුවල සැකකරුවන් සහ වැරැදිකරුවන් නිවාස අඩස්සියේ රඳවා තැබීමට නීති ප්‍රතිපාදන හඳුන්වාදීම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත.

එකී නිලධාරි කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පදනම්ව යෝග්‍ය නීති හඳුන්වාදීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.




# අධි සුඛෝපභෝගී දුම්රිය 2ක් කොට උඩ

## – දෙමටගොඩ අංගණයේ ගාල් කර දිරාපත්වීමට හැරලා, දුම්රියේ 'මනමාලියත්' ඒ අතර

ඉන්දික හේවාවිතාරණ

අධිසුඛෝපභෝගී දුම්රිය දෙකක් ධාවනයෙන් ඉවත්කර දිරාපත්වීමට ඉඩහැර තිබෙන බවත්, මෙම දුම්රිය දෙකම කොළඹ දෙමටගොඩ " ජෝන් හෝලන්ඩ්" දුම්රිය අංගණයේ ගාල් කර තිබෙන බවත් දුම්රිය වෘත්තීය සමිති සන්ධානය සඳහන් කරයි.

මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් කර, වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස හා අදාළ දුම්රිය දෙක නැවත ධාවනයට එක්කරන ලෙස ඊයේ (12දා) ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලිඛිතව ඉල්ලා සිටි බවද එම සන්ධානයේ සමකැඳවුම්කරු එස්.පී.විතානගේ මහතා සඳහන් කළේය.

චීනයෙන් ගෙන්වන ලද අධි සුඛෝපභෝගී දුම්රියක් සහ "දුම්රියේ මනමාලිය" ලෙස ජනතාව අතර කථාබහට ලක්ව තිබූ හිතාචි අධිසුඛෝපභෝගී දුම්රිය මේ ආකාරයට ධාවනයෙන් ඉවත් කර තිබෙන බවද හෙතෙම පැවසීය.

2019 වර්ෂයේ චීනයෙන් ආනයනය කර ඇති - 13 වර්ගයේ බලවේග කට්ටල දුම්රිය අධි සුඛෝපභෝගී මැදිරි 10කින් යුත් බවත්, මෙම බලවේග කට්ටල දුම්රිය ධාවනයෙන් ඉවත් කරනු ලැබුවේ මේ වසරේ ජනවාරි මාසයේදී බවත් එස්.පී.විතානාගේ මහතා සඳහන් කළේය.

එම මාසයේ සිට මස සිට අනුරාධපුර සිට වවුනියාව දක්වා දුම්රිය මාර්ගය නවීකරණය කිරීම සිදුකළ බවත්, මේ අනුව අදාළ දුම්රිය ධාවනයෙන් ඉවත් කළ බවත්, මාර්ග කොටස නවීකරණ කර මේ වන විට දුම්රිය ධාවන කටයුතු සාමාන්‍ය පරිදි සිදුකරන බවත් හෙතෙම කියා සිටියේය.

මෙම දුම්රියේ මැදිරිවල වායුසමන යන්ත්‍ර, ජෙනරේටර්ස්, ස්ටාර්ටර් මෝටර්ස්, ඕල්ටර්නේටර් මෝටර්ස්, බැටරි සහ සම්පූර්ණ වයර් පද්ධතිය ඇතුළු බොහෝ උපාංග සොරුන් විසින් ගලවා ගොස් තිබෙන බවට වාර්තා වන බවත්, මෙහි එක් මැදිරියක වටිනාකම දළ වශයෙන් රුපියල් කෝටි 14 කට අධික බවත් ඒ මහතා පැවසීය.

අනෙක් දුම්රිය, "මනමාලිය" ලෙස විරුදාවලිය ලත් හිතාචි දුම්රිය බවත් මෙහි එන්ජින් 04ක් සහ අධි සුඛෝපභෝගී මැදිරි 08ක් දිරාපත්වීමට ඉඩහැර තිබෙන බවත්, කොවිඩ් වසංගතය පැවති කාලසීමාවෙහි මෙම දුම්රිය එන්ජින් සහ මැදිරි පාවිච්චියෙන් ඉවත්කර අනාරක්ෂිතව අංගණවල රඳවා තිබෙන බවත් හෙතෙම සඳහන් කළේය. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කර දුම්රිය ආදායම් වැඩිකර ගැනීමට මෙම දුම්රිය යොදා ගැනීමේ හැකියාව තිබෙන බවද පැවසීය.

# රු.මි.872ක් වැයකරමින් ඇරඹූ දහම්පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතරමග නවතා දමලා

චන්දන සමරවික්‍රම

ආර්ථික අපහසුතාවලින් යුත් දිවයිනේ දහම් පාසල් සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 872ක් වැය කර තිබුණද, එම ඉදිකිරීමේ කටයුතු 2022 වර්ෂයේ ජූනි මාසයේ සිට අතර මඟ නවතා දමා ඇති බව පසුගියදා නිකුත් කර ඇති විගණන වාර්තාවක සඳහන් වේ.

දහම් පාසල් සඳහා ස්ථිර ගොඩනැගිලි 367ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව මගින් ඉදි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතය අපේක්ෂා කර තිබුණි. එහෙත් අමාත්‍ය මණ්ඩල අනුමතයෙන් තොරව 2023 මැයි මස රුපියල් මිලියන 872ක වියදමක් දරා දහම් පාසල් ගොඩනැගිලි 298 ක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර තිබේ.

තාක්ෂණික කමිටුවේ අනුමත මිල අනුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 1175කි. එහෙත් භෞතික ප්‍රගතිය අනුව කරන වැඩවල වටිනාකම රුපියල් මිලියන 872ක් බවද එම විගණන වාර්තාවේ සඳහන්වේ. ගොඩනැගිලි 367ක ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණ ද ඉදි කිරීම් අවසන් කළ ගොඩනැගිලි සංඛ්‍යාව 131ක් බවද විගණනය මගින් හෙළි කර ඇත.

# තැපැල් වර්ජනය අවසන්

## – ගැටලුවලට විසඳුම් නැතිනම් සෙසු රාජ්‍ය සේවකයන් සමග ඒකාබද්ධ වෘත්තීය ක්‍රියාමාර්ග

ඉන්දික හේවාවිතාරණ

ඉල්ලීම් හතරක් මුල්කර ගනිමින් පසුගිය 10වැනිදා සවස 4.00 සිට ක්‍රියාත්මක කළ තැපැල් සේවක වැඩවර්ජනය ඊයේ (12දා) මධ්‍යම රාත්‍රී 12.00න් අවසන් කළ බව ඒකාබද්ධ තැපැල් වෘත්තීය සමිති පෙරමුණ සඳහන් කරයි.

ඉදිරි දින කිහිපය තුළදී අදාළ ගැටලුවලට විසඳුම් ලබාදීමට කටයුතු නොකළහොත් අනෙකුත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල වෘත්තීය සමිති ඒකාබද්ධ කර ගනිමින් ඒකාබද්ධ වෘත්තීය ක්‍රියාමාර්ග සිදුකිරීමට තීරණය කර තිබෙන බවද එම සංගමයේ සමකැඳවුම්කරු චින්තක බණ්ඩාර මහතා පැවසීය.

නුවරඑළිය තැපැල් කාර්යාල ඇතුළු තැපැල් දෙපාර්තමේන්තුවේ දේපළ විකුණා දැමීමට සිදුකරන සැලසුම් අවලංගු කරන ලෙසත්, තැපැල් සේවකයන්ට ඇති වී තිබෙන පරිපාලන ගැටලු විසඳීමට අවශ්‍ය මුදල් ලබාදෙන ලෙසත්, තැපැල් සේවකයන් ඇතුළුව පොදුවේ සියලුම රාජ්‍ය සේවකයන්ට රුපියල් 20,000ක මාසික දීමනාවක් ලබාදෙන ලෙසත් හා තැපැල් සේවකයන් විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගත් ණයවලට අදාළ පොලී මුදල් අඩු කරන ලෙස ඉල්ලමින් 10වැනිදා සිට ඊයේ රාත්‍රී 12.00 දක්වා වැඩවර්ජන ක්‍රියාමාර්ගය සිදුකළ බවද හෙතෙම පවසා සිටියේය.

මේ අනුව වර්ජනය ක්‍රියාත්මක වූ කාලය තුළදී ලිපි ලක්ෂ 10කට ආසන්න ප්‍රමාණයක් හා පාර්සල් සුළු ප්‍රමාණයක් ගොඩගැසී තිබිය හැකි බවත්, එම සියලුම ලිපි හා පාර්සල් අද (13දා) දිනය තුළ බෙදාහැරීමට කටයුතු කරන බවත් චින්තක බණ්ඩාර මහතා පැවසීය.

# රාජ්‍ය සේවකයන්ට රු.20,000ක් දීමේ යෝජනාවක් අද සම්මත නොකළොත් වැඩවර්ජනයක් අරඹනවා

## – රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව

ඉන්දික හේවාවිතාරණ

රාජ්‍ය සේවකයන්ට ජනවාරි මාසයේ සිට රුපියල් 20,000ක දීමනාවක් ලබාදෙන ලෙස ඉල්ලා හා තවත් ඉල්ලීම් කිහිපයක් මුල්කර ගනිමින් ඊයේ (12දා) දින පැවති වැඩවර්ජනය සාර්ථක වූ බව රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව සඳහන් කරයි.

මේ අනුව අදාළ ගැටලු විසඳීම සඳහා අද (13දා) පාර්ලිමේන්තුව තුළදී යෝජනා සම්මත කර ගැනීමට කටයුතු නොකළහොත් ඉදිරියේදී වැඩවර්ජන හා විරෝධතා ව්‍යාපාර රැසක් සිදුකිරීමට සැලසුම් කර තිබෙන බවද එම එකමුතුවේ කමිටු සාමාජික ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේකම් චන්දන සූරියආරච්චි මහතා පැවසීය.

එසේම ඊයේ පැවැත්වූ වැඩවර්ජනය සඳහා සෞඛ්‍ය, අධ්‍යාපනය හා ප්‍රවාහන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට සම්බන්ධ රාජ්‍ය සේවකයන් සම්බන්ධ නොවන බවත්, එහෙත් ඉදිරියේදී සිදුකරන වෘත්තීය සමිති ක්‍රියාමාර්ග සඳහා එම සේවාවල සේවය කරන සේවකයන් සම්බන්ධ කර ගන්නා බවත් හෙතෙම පවසා සිටියේය.

එක්දින වැඩවර්ජනයට සමගාමීව ඊයේ දිස්ත්‍රික්ක 25 තුළ විරෝධතා ව්‍යාපාර 25ක් පැවැත්වීමටත් කටයුතු කළ බවත්, 20,000 දීමනාව ලබාදීමට අමතරව ඉහළ දමා තිබෙන වැන්දඹු හා අනත්දරු අරමුදලට අයකර ගන්නා මුදල පහළ දැමිය යුතු අතර, 2016 වසරින් පසු අහිමි කර තිබෙන පූර්ණ විශ්‍රාම වැටුප නැවත ලබාදිය යුතු බවත්, 2014 වසරේදී අහිමි කළ ශ්‍රේණි උසස් ක්‍රමය නැවත ක්‍රියාත්මක කළ යුතු බවත් හෙතෙම පවසා සිටියේය.

# ආදිවාසී ප්‍රජාව සඳහා නව පාර්ලිමේන්තු පනතක්

නවෝද්‍යා පවනි

මෙරට ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂා කිරීම සඳහා නව පාර්ලිමේන්තු පනතක් සකස් කිරීමට අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතා පොරොන්දු වී තිබේ.

ඒ ආදිවාසී නායක වනස්පති ඌරුවරිගේ වන්නිල ඇත්තන් සහ විජේදාස රාජපක්ෂ මහතා අතර පාර්ලිමේන්තුවේදී පැවති සාකච්ඡාවෙන් අනතුරුව ය. මෙහිදී ඇමතිවරයා බලධාරීන් දැනුවත් කරමින් කියා සිටියේ ඊයේ (12දා) නව පනත සකස් කිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කළ බව ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙරට ආදිවාසීන් මුහුණදෙන ගැටලු සම්බන්ධයෙන් සකස් කළ වාර්තාවක් සියලු ම ප්‍රාදේශීය ආදිවාසී නායකයන්ගේ ද සහභාගිත්වයෙන් කථානායකවරයා, අගමැතිවරයා සහ විපක්ෂ නායකවරයා වෙත මේ වසර මුල දී ඉදිරිපත් කර සාකච්ඡා කළ අතර එහිදී අදාළ බලධාරීන් පොරොන්දු වූයේ වසරක් ඇතුළත ආදිවාසී ප්‍රජාවගේ අයිතීන් සුරක්ෂිත කිරීම වෙනුවෙන් පනතක් සකස් කරන බව ය.

එකී කටයුත්තෙන් පසු අදියර ගණනාවක සාකච්ඡාවලින් අනතුරුව අධිකරණ ඇමතිවරයා අදාළ පනත සකස් කිරීමට පොරොන්දුවීම සහ අදාළ බලධාරීන් ඒ වෙනුවෙන් යොමු කිරීම තමා සහ තම වර්ගය ලැබූ ජයග්‍රහණයක් බව ආදිවාසී නායකවරයා පවසා සිටියේ ය. ආදිවාසී ප්‍රජාව සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර සම්බන්ධීකරණය සිදු කරනු ලබන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසිනි.

